// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2134/54 – 2019 අගෝස්තු 02 වැනි සිකුරාදා – 2019.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/P/2015/185.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.01.22 දිනැති හා අංක 2055/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.01.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බිබිල, කැබැල්ල පිටිය, රුවන් සෙවන හි පදිංචි එච්. එම්. ආරියපාල මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.07.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නාරාහේන්පිට කාර්මික අධිකරණයේ දී ය.**

එච්. එම්. ආරියපාල මයා,
රුවන් සෙවන,
කැබැල්ල කැටිය,
බිබිල.
*(පළමු පාර්ශ්වය)*

බේරුම්කරණ අංක : A/08/2018
IR/COM/05/P/2015/185.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළපාර,
කොළඹ 05.
*(දෙවන පාර්ශ්වය)*

**අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න ගරු අමාත්‍යතුමාගේ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 2968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, 2018.01.17 දින පත්කොට මා වෙත යොමුකොට ඇත.

වර්ෂ 2017 දෙසැම්බර් මස 28 දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පහත පරිදි දැක්වේ.

''දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මහියංගන ඩිපෝවේ V වන ශ්‍රේණියේ නිලධාරියකු ලෙස සේවය කරන එච්. එම්. ආරියපාල මහතාගේ සේවය 2013.06.01 දින සිට ඔහුට විරුද්ධව සිදුකරනු ලැබූ විනය පරීක්ෂණයේ විනය නියෝගය ක්‍රියාත්මක වන කාලය තෙක් වැටුප් රහිතව තහනම් කිරීමෙන් අහිමි වූ වේතනය හා අනෙකුත් දීමනා ඉල්ලා සිටීම යුක්තිසහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත්,

සහ

එම විනය පරීක්ෂණයේ විනය නියෝගය/අභියාචන නියෝගය පරිදි 2014.02.25 දින සිට අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරු කිරීම හා 2014.08.01 දින සිට 2015.01.31 දින දක්වා වේතන රහිතව අත්හිටුවීම මගින් අසාධාරණයක් සිදු වී ඇතැයි ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

මා විසින් 2018.05.09 දින නඩු විභාගය ආරම්භ කළ අතර, පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර එච්. එම්. ආරියපාල මහතා වෙනුවෙන් නියෝජිත ඒ. ඩී. වික්‍රමසිංහ මහතා සහ දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ දිමුතු පනන්ගල මහත්මිය පෙනී සිටිමින් සිය පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කර තිබුණි. 2018.05.09 දින බේරුම්කරණය විසින් කරන ලද දැන්වීමට අනුව පළමු පාර්ශ්වය විසින් සමථ යෝජනාවක් ද ඉදිරිපත් කර තිබුණි.

2018.06.11 දින නඩු විභාගය නැවත ආරම්භ කළ අතර එදින පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සමථ යෝජනාව දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇති බව ද දන්වා සිටින ලදී.

මෙදින පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ඒ. ඩී. වික්‍රමසිංහ මහතා පෙනී සිටි අතර, දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ දිමුතු පනන්ගල මහත්මිය සමග රජයේ නීතිඥ හේෂානී කළුබෝවිල මෙනෙවිය පෙනී සිටි අතර, පළමු පාර්ශ්වය විසින් සිය නඩුව ආරම්භ කරන ලදී. ඉල්ලුම්කරු වන හේරත් මුදියන්සේලාගේ ආරියපාල මහතා සාක්ෂියට කැඳවන ලදී.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර හේරත් මුදියන්සේලාගේ ආරියපාල මහතා සාක්ෂි දෙමින් තමා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙක් වශයෙන් සේවයට බැඳී විධායක නිලධාරි තනතුර දක්වා උසස්වීම් ලැබ දැනට සේවය කරමින් සිටින බව ප්‍රකාශ

කරන ලදී. තමන්ට වයඹ ප්‍රාදේශීය කාර්යාලයට ස්ථාන මාරුවක් ලැබුණ බවත්, අදළ ස්ථාන මාරුවීම් ලිපිය A1 වශයෙන් සලකුණු කරමින් ගරු බේරුම්කරණය වෙත යොමු කරන ලදී. තවද, මෙම ස්ථාන මාරුවීම් ලිපියට අනුව තමා බඩු භාරදීම සඳහා බිබිල ඩිපෝව වෙත ගිය බව ද සාක්ෂි දෙමින් පවසා සිටියේ ය. තමන්ට මෙම ස්ථාන මාරුවීම ලැබුණේ පළිගැනීමක් ලෙස බවත්, එයට හේතුව වූයේ ඉන්ධන වංචාවක් සම්බන්ධයෙන් තමන් විනය ලිපිකරු ලෙස පරීක්ෂණයක් ආරම්භ කිරීමට කටයුතු කළ බවත් ඊට අදළ චෝදනාවන්ට ප්‍රාදේශීය ඉංජිනේරුවරයා හා ඩිපෝ කළමනාකාරවරයා සම්බන්ධව සිටි බවත් ය. එහෙත් මේ සම්බන්ධයෙන් කිසිඳු සාක්ෂියක් පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් නොකරන ලදී. ස්ථාන මාරුවීම් ලිපියෙහි බඩු භාරදීමට යොමුකොට ඇති බිබිල ඩිපෝවේ ආරක්ෂක පරීක්ෂක වෙත යන කොටස A1 a වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කරන ලදී. තමන් බිබිල ඩිපෝවට ගියේ ස්ථාන මාරුවීම් ලිපිය අනුව බවත් එසේ එම ලිපියට අනුව බඩු භාරදීම සඳහා බිබිල ඩිපෝව වෙත යාමට තමන්ට අවසර ඇති බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදී. (2018.05.09 වැනි දින සාක්ෂි සටහන්වල පිටු අංක 8 සහ 9 හෙවත් ගොනුවේ පිටු අංක 40 සහ 41) තමාගේ වැඩ තහනම් කර ඇති ලිපිය අත්සන් කර ඇත්තේ සහකාර මානව සම්පත් කළමනාකරු බවත් ඔහුට විනය බලතල නොමැති බවත් ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ අදාළ කොටස A2 b ලෙස සලකුණු කරමින් ඉදිරිපත් කරන ලදී.

තවද තමාට චෝදනා පත්‍රයක් ලැබුණු බවත් එය A3 a වශයෙන් සලකුණු කරන බවත් සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද, තමන්ගේ සේවය තහනම් කිරීමේ ලිපියේ දිනය 2013.05.27 දින බවත් චෝදනා පත්‍රයේ දිනය 2013.05.14 දින බවත් වැඩ තහනමට ප්‍රථම චෝදනා පත්‍රය ලැබුණ බවත් ලේඛන සලකුණු කරමින් සාක්ෂි දෙන ලදී. (2018.05.09 වැනි දින සාක්ෂි සටහන් පිටු අංක 12 හෙවත් ගොනුවේ පිටු අංක 44) මෙහිදී චෝදනා පත්‍රයේ සඳහන් 01 වෙනි චෝදනාවට තමා නිවැරදිකරු බවත්, (2018.05.09 සාක්ෂි සටහන්වල පිටු අංක 13 හෙවත් ගොනුවේ පිටු අංක 45). දෙවැනි චෝදනාව සම්බන්ධයෙන් සාක්ෂි දෙමින් සාක්ෂිකරු විසින් ''හිතාමතා පැහැර හැරියා කියන කථාවට තමුන් ගොදුරු වෙනවාද?'' යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු විසින් ''එහෙමයි'' යනුවෙන් පිළිතුරු දීමෙන් (2018.05.09 දින සාක්ෂි සටහන් පිටු අංක 14 හෙවත් ගොනුවේ පිටු අංක 46) ඉල්ලුම්කාර සාක්ෂිකරු විසින් චෝදනා පත්‍රයෙහි දෙවැනි චෝදනාව පිළිගෙන ඇති බවට අධිකරණයේ නිරීක්ෂණයට ලක්විය. 03 වැනි චෝදනාවට තමා නිවැරදිකරු බව ද සාක්ෂිකරු කියා සිටින ලදී. තවද 04 චෝදනාවට ද තමන් නිවැරදිකරු බවත්, 5 චෝදනාව චෝදනාවක් නොවන බවද සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. තවද, චෝදනා පත්‍රය අත්සන් කර ඇත්තේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ධාවන) බවත් (A3) ඔහු විනය ව්‍යවස්ථාවේ බලරහිත පුද්ගලයකු බවත් සාක්ෂි දෙමින් තහවුරු කර ඇත. තමා චෝදනා පත්‍රයේ අඩංගු චෝදනා 5ටම නිවැරදිකරු බව සාක්ෂිකරු පැවසීය. (2018.05.09 සාක්ෂි සටහන් පිටු අංක 16 සහ 17 හෙවත් ගොනුවේ පිටු අංක 48 සහ 49).

එහෙත් 2018.05.09 වැනි දින සාක්ෂි සටහන් පිටු අංක 14 හෙවත් ගොනුවේ පිටු අංක 46 හි සාක්ෂිකරු විසින් තමා දෙවැනි චෝදනාවට වරදකරු බවට පිළිගෙන තිබීම පරස්පර විරෝධී සාක්ෂියක් බව පැහැදිළි වේ. තවද, එදිනම සාක්ෂි සටහන්වල පිටු අංක 17 හෙවත් ගොනුවේ පිටු අංක 49 වැනි පිටුවේ සාක්ෂිකරුගේ සාක්ෂිවලින් විනය විභාගයේදී විනය පරීක්ෂක විසින් විශේෂ සටහනක් තැබූ බවත්, එය අනවසරයෙන් මණ්ඩලීය භූමියට ඇතුළත්වී නැති බවට යෙදූ සටහනක් බවට සාක්ෂි ලබා දුන්නද කිසිදු අවස්ථාවක එය තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවද විශේෂයෙන් සැළකිල්ලට ගනු ලැබූවෙමි. තවද, සාක්ෂිකාර ආරියපාල මහතා සාක්ෂි ලබාදෙමින් විනය නියෝගය අත්සන් කර ඇත්තේ ද, සහකාර මානව සම්පත් කළමනාකරු බවත්, එය සේවය තහනම් කරන ලද නිලධාරියා විසින්ම බවත් ලේඛන මගින් තහවුරු කරන ලදී. තවද, විනය නියෝගය නිකුත් කළ යුත්තේ විනය විභාගය අවසන්වී දින 14 ක් තුළ බවට සාක්ෂි දෙමින් අදාළ විනය ව්‍යවස්ථාවේ 4.10 නියෝගය සලකුණු කරමින් ඉදිරිපත් කරන ලදී. (A5a). තමා මේ සම්බන්ධයෙන් අභියාචනයක් සිදුකළ බවත්, අභියාචනයෙන් ද තමන් වැරදිකරු වූ බවත්, අභියාචනා නියෝගය අත්සන් කර ඇත්තේ ද, සහකාර මානව සම්පත් කළමණාකරු (විනය) විසින් බවත් ඒ අනුව සේවය තහනම, විනය නියෝගය හා අභියාචනා නියෝගය එකම පුද්ගලයකු විසින් අත්සන් කර ඇති බවට සාක්ෂි ලබාදෙමින් ලේඛන ලකුණු කරන ලදී (A7a). තවද, තමන්ට අදාළ විනය නියෝගය සමග ස්ථාන මාරුවක් ලැබුණ බවත්, එය තමන් සේවය කළ ස්ථානයේ සිට කිලෝ මීටර් 240 ක දුරක පිහිටි සේවා ස්ථානයකට බවත්, සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටින ලද අතර, ඉල්ලුම්කාර සේවකයාගේ නියෝජිත මහතා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු සපයමින් ''ස්ථාන මාරුව සඳහා කැමැත්ත ප්‍රකාශකර ලිපියක් ලබා ගත්තා ද'' යන ප්‍රශ්නයට පිළිතුරු සපයමින් ''එහෙමයි'' (2018.05.09 සාක්ෂි සටහන්වල පිටු අංක 24 හෙවත් ගොනුවේ පිටු අංක 56) යනුවෙන් පිළිතුරුදීම තුළින් සාක්ෂිකරු ස්ථානමාරුව සඳහා තමාගේ කැමැත්ත ලබාගත් බවට තමන් විසින්ම තහවුරු කර ඇත.

තමන්ගේ සේවය අත්හිටුවීම හේතුකොට ගෙන තමන්ගේ දුවට ලැබීමට නියමිතව තිබූ සේවා නියුක්තීන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව දීමනාව නොදීමට හේතු වශයෙන් සේවය තහනම් කර ඇති කාලය තුළ අරමුදලට මුදල් ලැබී නොමැතිවීම හේතුකොටගෙන බව සටහන් කර ඇති ලිපිය A10 ලෙස සලකුණු කරමින් ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව තමන්ට ලැබීමට ඇති මුදල රු. 15000/- ක් බවද, තවද, තමන්ට සේවය තහනමට ලක්කරන ලද සම්පූර්ණ කාලයට

වැටුප් ද, අම්බලන්තොට ඩිපෝවට යාම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් ලබානොදීම හේතුවෙන් දෛනිකව රු. 800/- ක පමණ මුදලක් සම්පූර්ණ කාලය වෙනුවෙන් ගණන් බලා ලැබිය යුතු බවද, 2013, 2014 සහ 2015 වර්ෂවල ගමනාගමන මණ්ඩලය විසින් ගෙවන ලද පාරිතෝෂික දීමනාව රු, 6000/- ක් අහිමිවී ඇති බවද, තමන්ට සම්පූර්ණයෙන්ම රුපියල් 5,50,000/- මුදලක් ලැබිය යුතු බවද සාක්ෂි දෙමින් කියා සිටි අතර එදින මෙම මූලික සාක්ෂිය අවසන් කරන ලදී.

2018.07.19 වැනි දින සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදුව දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම රජයේ නීතිඥ හේෂාණි කළුබෝවිල මෙනවිය විසින් සිදුකරන ලද අතර එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් තමන් බිබිල ඩිපෝව වෙත ගියේ දුරකථනයෙන් තමාට ලැබුණු තොරතුරු අනුව තමාගේ බඩු භාරදීමට බවත්, එම දුරකථන ඇමතුම් මගින් තමාට දැනගන්නට ලැබුණේ ස්ථාන මාරුකර ඇති බව පමණක් බවත් බඩු භාරදීම සම්බන්ධයෙන් කිසිදු දැනුම්දීමක් නොලැබුණු බවත්, තවද, ලැබුණු දුරකථන ඇමතුම් රාජකාරි මට්ටමින් ලැබුණු දුරකථන ඇමතුම් නොවන බවත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂි ලබාදෙන ලදී. තවද, තමාට බඩුබාහිරාදිය භාරදෙන ලෙස ආයතනයෙන් දැනුම්දීමක් නොකල බවද තමා ස්වේච්ඡාවෙන්ම ආයතනයට ගිය බවද, 2018.07.19 වැනි දින හරස් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් සාක්ෂිකරු සනාථකර ඇත. (එදින සාක්ෂි සටහන්වල පිටු අංක 13 සහ ගොනුවේ පිටු අංක 73). තවද, තමන් ප්‍රශ්නගත 2014.02.17 දින ආයතනයේ සේවයට වාර්තා කළේ වගකිව යුතු නිලධාරියෙකුට ලේඛන භාරදීමට බවද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂි ලබාදෙන ලදී. තවද, එසේ ලේඛන භාරදිය යුතු වගකිව යුතු නිලධාරියා ආරක්ෂක කළමණාකරු බවත්, නමුත් මෙම කාලය තුළ ඩිපෝවේ අරක්ෂක කළමනාකාරවරයෙකු නොසිටි බවත්, සිටියේ ආරක්ෂක පරීක්ෂකයකු පමණක් බවත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පිළිගන්නා ලදී. කෙසේ වුවද, සාක්ෂිකරු තම මූලික සාක්ෂියේදී තමාට ස්ථාන මාරුවීම් ලිපි ලැබුණේ 2013.02.17 දින බව ප්‍රකාශ කර ඇති බව පිළිගත් අතර එය අසත්‍ය ප්‍රකාශ කිරීමක් නොව තමන්ට දින පිළිබඳ වූ වැරදීමක් බවද සාක්ෂිකරු පවසා සිටින ලදී. නැවත ප්‍රශ්න කිරීම්වලදී ද මේ බව තහවුරු කරමින් සාක්ෂිකරු සාක්ෂි ලබා දී තිබේ. එනම් ඉරිදා දිනක තමන් බිබිල ඩිපෝවට පැමිණි බවට සාක්ෂිකරු සාක්ෂි ලබා දී තිබේ. ඒ අනුව සාක්ෂිකරු හිතාමතාම අසත්‍ය සාක්ෂි ලබාදී නොමැති බව පැහැදිලිවේ. එය හුදෙක් දිනය පිළිබඳ වූ වැරදීමක් බව පැහැදිලි වේ. කෙසේ වෙතත් දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න අසන ලද නීතිඥ මහත්මිය විසින් අදාළ කොටස පරස්පරයක් සලකුණු කරන ලද අතර එය R2 ලෙස සලකුණු කර ඉදිරිපත් කර සිටින ලදී.

තවදුරටත් හරස් ප්‍රශ්නවලට ලක් කරමින් සාක්ෂිකරු විසින් මූලික විමර්ශනයේදී ලබා දුන් සාක්ෂිය පිටු 04 කින් යුත් සාක්ෂිය R3 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශය අනුව 2005 සිට 2010 දක්වා විනය ලිපිකරු ලෙස සේවය කරන ලද බව සාක්ෂිකරු පිළිගනී. තවද, 4 වගන්තිය යටතේ විනය ලිපිකරුවකු ලෙස 2012 ඔක්තෝබර් මාසයේ සිට නැවත විනය පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බවද සාක්ෂිකරු පිළිගෙන ඇත. එය R3a ලෙස සලකුණු කර ඇත. (2018.07.19 සාක්ෂි සටහන්වල පිටු අංක 27 හෙවත් ගොනුවේ පිටු අංක 87). තවදුරටත් හරස් ප්‍රශ්නවලට සාක්ෂිකරු භාජනය කරමින් ඔහු විසින් 2013 පෙබරවාරි මස සම්බන්ධයෙන් සකස් කරන ලද දිනපොත තමා 2013 මාර්තු මස 01 දින ඉදිරිපත් කළ බව පිළිගන්නා ලද අතර අදාළ දින පොත තමන් විසින් ඉදිරිපත් කරන ලද දිනපොත බවද පිළිගන්නා ලදී. එය R4 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ අනුව අදාළ සිද්ධිය සිදු වූ 2013.02.17 දින තමන් ඩිපෝවට ගිය බවත් තමන්ට පැමිණීමේ ලේඛනය අත්සන් කිරීමට ඉඩ නොදුන් බවත් ඩිපෝ කළමනාකරුගෙන් අවසර නොගෙන අත්සන් කිරීමට ඉඩ දිය නොහැකි බව පැවසූ බවද, සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවසා ඇත. තවද, තමන්ට ආරක්ෂක අංශයේ ආරක්ෂක පරීක්ෂක විසින් අත්සන් කිරීමට ඉඩ නොදුන් බවද, එහෙත් තමන් ආයතනයට ඇතුළු වී ලේඛන පරිහරණය කළ බවද, හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පිළිගෙන ඇත. (2018.07.19 දින සාක්ෂි සටහන් පිටු අංක 34 හෙවත් ගොනුවේ පිටු අංක 94). මෙයද මෙම ඉල්ලුම්කාර සාක්ෂිකරු විසින් 2013.02.17 දින යම් ආකාරයක වරදක් සිදු කලාද යන සැකය මතුවීමට හේතුවක් වේ. මන්ද යත් තමන්ට නිසි පරිදි ලිපියක් ලැබීමට පෙර, නිසි උපදෙසකින් තොරව බඩු භාරදීමට ඉල්ලුම්කරු ඩිපෝව වෙත ගියා යන්න පිළිගත හැකි කරුණක් නොවේ. තවද, තමන් රාජකාරියක් සිදුකලා නම් දින පොතින් ඒ බව සනාථ වී තිබිය යුතු  බවද තමන් අදළ දින පොතෙහි එවැනි සටහනක් නොකල බවද, තමන් එය එතරම් බරපතල සිදුවීමක් ලෙස නොසැලකු බවද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂි කරු පවසා ඇත. (2018.07.19 හරස් ප්‍රශ්න සාක්ෂි සටහන් පිටු අංක 35 හෙවත් ගොනුවේ පිටු අංක 95). තවද, 2013 පෙබරවාරි මාසයේ 03 වැනි දින සහ 10 වැනි ඉරිදු දිනයන්වල සේවයට ගිය බවට මාසික දිනපොතෙහි සඳහන් කර ඇති බවද, එහෙත්  තමා සේවයට ගිය 2013.02.17 දින පිළිබදව දිනපොතෙහි  සටහන් නොකළ බවද සාක්ෂිකරු විසින් පිළිගෙන ඇත. (2018.07.19) සාක්ෂි සටහන් පිටු අංක 37 හෙවත් ගොනුවේ පිටු අංක 97). සාක්ෂිකරුගේ අනෙකුත් රාජකාරි කටයුතු දෙස බැලූ විට මෙය හිතාමතා කළ දෙයක් බව පැහැදිලි වේ. තවද 2013.02.17 වැනි දින මොහු අදාළ නොවන රාජකාරියක් කිරීමට කටයුතු කළාද යන ප්‍රශ්නාර්ථය පැන නගී.

තවද, තමා නීත්‍යානුකූලව බඩු භාරදීමට ආයතනයට පැමිණියේ 2013.02.27 දින බව සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් පිළිගෙන ඇත. තව ද මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට  පිළිතුරු සපයමින් මෙසේ ප්‍රකාශ කර ඇත. ''මට මේ වෙනකොට ස්ථාන මාරුවක් ලැබිල තිබුණෙ නැහැ. ඒ නොලැබීම මත  එදින මට අත්සන් කරන්න අවස්ථාවක් ලබා දුන්නා නම් මම නීත්‍යානුකූලව  සේවයට වාර්තා කිරීමක් වෙනවනේ. එහෙම අවස්ථාව නොලැබීම මත තමයි සිදුවීම සිදුවෙන්නේ ස්වාමිනී'' (2018.07.19 හරස් ප්‍රශ්න සාක්ෂි සටහන් පිටු අංක 47 හෙවත් ගොනුවේ පිටු අංක 107).  මෙම පිළිතුරෙන් ද ගම්‍ය වනුයේ මොහු තමන්ට ස්ථාන මාරුවීමේ ලිපිය නොලැබ එකී ස්ථානයට යාම සාධාරණීකරණය කිරීමට උත්සාහ කර ඇති බවයි.

තවදුරටත් හරස් ප්‍රශ්න ඇසීමේ දී 2018.07.19 දින සාක්ෂි සටහන් පිටු අංක 49 හි (ගොනුවේ පිටු අංක 109) රජයේ නීතිඥවරිය අසන ලද ප්‍රශ්නයකට පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුගේ රැකවරණ නිලධාරී තම විරෝධය පළකරමින් කරුණු දක්වා ඇති අතර එම විරෝධතාවය මෙසේ සටහන් කර ඇත. ''ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර සිටින්නේ එම ප්‍රශ්නයට විරෝධතාවය පළකර සිටින බවයි. සාක්ෂිකරුගේ දින පොත එයට සාක්ෂි දරන බව පවසන අතර විවේක දිනය මොකක්ද, විවේක දිනයේ රාජකාරියට ආවානම් මොකක්ද කලේ කියලා එහි සඳහන් වන බව කියා සිටී. *මෙතනදී ප්‍රස්තුත දිනයෙහි පමණක් පොඩි ගැටළුවක් තිබෙන බව ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් පවසයි*" එනම් මෙම චෝදනාවට ලක්වන දිනදී යම් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇති බව පළමු පාර්ශ්වය විසින්ම පිළිගෙන ඇත.

තවදුරටත් හරස් ප්‍රශ්න අසමින් සාක්ෂිකරු විසින් මූලික විමර්ශනයේදී ඔහු ලබා දුන් ප්‍රකාශය පිළිබඳ ප්‍රශ්න කිරීමේදී අදාළ ලිපිගොනු 12 තමා භාරයේ තිබූ ඒවාය යන්න කීමට තමාට නොපුළුවන් බවට සාක්ෂිකරු සාක්ෂි ලබාදෙන ලදී. මෙහිදී මේ පිළිබඳව තවදුරටත් හරස් ප්‍රශ්න මගින් ප්‍රශ්න කරමින් රජයේ නීතිඥ මහත්මිය විසින් විමසා සිටීමේදී එම ලිපි ගොනු තමා භාරයේ තිබූ ලිපිගොනු බව සාක්ෂිකරු පිළිගන්නා ලදී. (2018.07.19 දින සාක්ෂි සටහන් පිටු අංක 67 හෙවත් ගොනුවේ පිටු අංක 127). තවදුරටත් තමන් මූලික විමර්ශනයේදී එසේ ප්‍රකාශයක් ලබා දුන් බවද පිළිගත්තේය. මෙහිදී එම කොටස් R3(c) ලෙස පරස්පරතායවක් ලෙස සලකුණු කරන ලදී. තවදුරටත් R3 ලේඛනය පරීක්ෂා කර බලා පිළිතුරු දෙමින් එම ලේඛන පිළිබඳ සම්පූර්ණ විස්තරයක් අදාළ ලේඛනයේ ඇති බව සාක්ෂිකරු පිළිගෙන ඇත. (2018.07.19 සාක්ෂි සටහන් පිටු අංක 67 හෙවත් ගොනුවේ පිටු අංක 127).

තවද, මෙම ඉල්ලුම්කාර සාක්ෂිකරු විසින් තමන්ට චෝදනා එල්ල වී ඇති ලිපිගොනු 12 සම්බන්ධයෙන් මූලික විමර්ශනයේදී ලබා දී ඇති ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන ඇති අතර, අදාළ ලිපිගොනු 2007, 2008 කාලයට අයත් ධා 15 වාර්තා බවද පිළිගෙන ඇත. එමෙන්ම 2012 දී නැවත විනය අංශයට අනුයුක්ත කිරීමෙන් අනතුරුවද ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග නොගත් බවද සාක්ෂිකරු විසින් පිළිගෙන ඇත. තවද R3 ලේඛනයෙහි එම ලිපිගොනු සම්බන්ධයෙන් සටහන් වී ඇත. එනම් ''එම ධා15 වාර්තා කිසිවක් වෙනුවෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව පිළිගන්නා අතර, මාගේ අතපසුවීමක් වන අතර, විනය ක්‍රියාමාර්ග ගත හැකි බව පිළිගනිමි.'' යන කොටස R3(d) ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳ කිසිදු විරෝධතාවයක් සාක්ෂිකරු විසින් ඉදිරිපත් නොකරන ලදී. මේ සම්බන්ධයෙන් තවදුරටත් හරස් ප්‍රශ්න අසමින් ඉල්ලුම්කාර සාක්ෂිකරු විසින් තමන් ලඟ තබාගෙන තිබූ එම ලිපිගොනු සම්බන්ධයෙන් කටයුතු කිරීම තම වගකීම බව පිළිගන්නා ලද අතර එම කටයුතු සම්බන්ධයෙන් තමන් අතින් ප්‍රමාදවීමක්, අතපසුවීමක් සිදුවෙලා ඇති බවද සාක්ෂිකරු පිළිගන්නා ලදී. (2018.09.07 දින සාක්ෂි සටහන් පිටු අංක 13 සහ 14 හෙවත් ගොනුවේ පිටු අංක 142, 143). දෙවැනි පාර්ශ්වය විසින් තම ලිඛිත දේශනවල සටහන් කර ඇති

''Calcutta Jute Manufacturing Company Ltd' *vs*. Calcutta Jute Manufacturing workers' Union (1961 (2) LLJ 686 (SC) - Refusal to obey reasonable orders justifies dismissal''

අදාළ නඩු තීන්දුවට අනුව ලබාදෙන ලද නීත්‍යානුකූල නියෝග පැහැර හැරීම සේවයෙන් ඉවත් කිරීමට තරම් හේතුවන බව දක්වා ඇත.

එම නඩුවට අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත යොමුකර ඇති ධා 15 වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නියෝග කොට ඇති නීත්‍යානුකූල නියෝග නොසලකා හරිමින් කටයුතු කර ඇති බව සාක්ෂිවලින් තහවුරු වී ඇත. ඒ අනුව මොහු හිතාමතාම වරදක් සිදුකර ඇති බව තහවුරු කර ඇත.

තවදුරටත් හරස් ප්‍රශ්න විමසීමේදී සාක්ෂිකරුට එරෙහිව පැවැත්වූ විනය පරීක්ෂණයේදී ඔහු විසින් සාක්ෂි ලබා නොදුන් බවට රජයේ නීතිඥවරිය විසින් ගෙන එන ලද යෝජනාවට ඉල්ලුම්කාර සාක්ෂිකරු පිළිතුරු දී ඇත්තේ මතක නැත යනුවෙනි. එහෙත් විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ පිටු අංක 67 හා අවසාන ඡේදය R5 ලෙස සලකුණු කරමින් මෙම ඉල්ලුම්කරු විනය පරීක්ෂණයේදී සාක්ෂි ලබා නොදුන් බව තහවුරු කරන ලද අතර සාක්ෂිකරු විසින් එය පිළිගන්නා ලදී. තවද එම විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසුවාද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකරු විසින් පරස්පර විරෝධී පිළිතුරු කිහිපයක් ලබා දුන් අතර පසුව එය තමන්ට මතක නැති බව ප්‍රකාශ කරන ලදී. මෙවැනි පරස්පර විරෝධී පිළිතුරු කිහිප අවස්ථාවකදීම සාක්ෂිකරු විසින් ලබාදීමෙන් සාක්ෂිකරුගේ සාක්ෂි පිළිබඳ ඇති විශ්වසනීයත්වයට හානියක් සිදුවීම වැලැක්විය නොහැකි අතර ඒ පිළිබඳව ද මෙම ප්‍රදානය ලබාදීමේදී සැලකිල්ලට භාජනය නොකළා නම් එය යුක්ති සහගත සහ සාධාරණ නොවනු ඇති බව මාගේ විශ්වාසයයි.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි රැකවරණ නිලධාරී විසින් නැවත ප්‍රශ්න ඇසීම සිදු කර ඇති අතර හරස් ප්‍රශ්නවලින් නගන ලද ඉතා වැදගත් මූලික තර්කයන් බිඳ හෙලීමට කටයුතු කර නොමැති අතර, ඉල්ලුම්කාර සාක්ෂිකරුගේ ස්ථාන මාරුව නීත්‍යානුකූලව සිදුකර නොමැති බවට කරුණු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2005 අංක 27 දරන පනත ඒ 13 වශයෙනුත් 33 වගන්තිය ඒ 13 ඒ වශයෙනුත් සලකුණු කර ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශ්වය විසින් තවදුරටත් සාක්ෂිකරුවෙකු කැඳවුවද ඔහු සොයාගත නොහැකි බැවින් තම නඩුව අවසන් කරන ලද බව ප්‍රකාශ කරන ලද අතර, ඒ අනුව 2018.10.09 වන දින ඒ 1 සිට ඒ 13 (ඒ) දක්වා ලේඛන ලකුණු කරමින් පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කරන බව ගරු බේරුම්කරණය වෙත දැනුම් දෙන ලදී.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සිය නඩුව ආරම්භ කරමින් සාක්ෂි කැඳවා ඇති අතර 2018.11.12 වැනි දින සහකාර විමර්ශන නිලධාරී සුජීව සම්පත් ජයසේකර යන අය සාක්ෂි ලබාදීම ආරම්භ කරන ලදී. එසේ සාක්ෂි දෙමින් සාක්ෂිකරු විසින් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත 2012.12.21 දිනැති චෝදනා පත්‍රයක් ඇති බවට සාක්ෂි ලබාදුන් අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් අත්සන් තබා ඇති චෝදනා පත්‍රය R6 ලෙස සලකුණු කරන ලදී. එය ඉන්ධන බිල්පතක් වෙනස් කිරීමට ආධාර අනුබල දීම යටතේ නිකුත් කර ඇති බවද සාක්ෂි ලබාදෙන ලදී. තවද, එම චෝදනා පත්‍රය සම්බන්ධයෙන් සියලු චෝදනාවලට වරදකරු වීමෙන් 2013.05.16 දාතමෙන් යුතුව සහකාර මානව සම්පත් කළමණාකරු (විනය) විසින් ලබාදෙන ලද දඬුවම R7 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම දඬුවම අනුව මාස 3 කට සේවය අත්හිටුවීමට නියම කර ඇත.

ඉන්පසුව මෙම ඉල්ලුම්කරුට බිබිල ඩිපෝවේ ඩිපෝ කළමනාකරු, විසින් සේවා ස්ථානයෙන් බැහැරව යාම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීමක් ද සිදුකර ඇත (2018.11.12 සාක්ෂි සටහන් පිටු අංක 9 හෙවත් ගොනුවේ පිටු අංක 221). එකී උපදෙස් ලිපිය R8 වශයෙන් සලකුණු කර ඇත. මෙම ලේඛනය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ නියෝජිත මහතා විසින් ගෙන එන ලද විරෝධතාවය වූයේ එම ගොනුවෙන් ගැලවී ඇති පසුව අමුණා ඇති ලේඛනයක් බවයි. ඒ සම්බන්ධයෙන් අවධානයට ලක් කරන ලද අතර, එම ලේඛනය අඩංගු ලිපිගොනුව මාගේ නිරීක්ෂණයට ලක් කළ අතර එම ලිපිය ඉතා තුනී කඩදාසියක සකස් කර තිබූ එකක් බවත් (පිටපතක්), ගොනුවෙහි අදාළ පිටු අංකනයන් නිවැරදිව කර තිබූ බවත් නිරීක්ෂණය විය. එහෙත් මෙම ලිපියට අදාළ කිසිඳු ලිපියක් මෙම ගොනුවෙහි අදළ ලිපියට ඉදිරියෙන් හෝ පිටුපසින් ගොනුකර නොතිබුණු බැවින් මෙම ලේඛනය ඇත්ත වශයෙන්ම මෙකී R 8 ලේඛනයම ද යන්න තහවුරු කර ගැනීමට අපහසු විය. ඊට හේතුව එතැනට වෙනත් ලේඛනයක් ඇතුළත් කිරීමට අවශ්‍ය නම් හැකියාව තිබුණු බව ද නිරීක්ෂණය කළ අතර එම ලිපිය මෙම ප්‍රදානයෙහිදී නොසලකා හැරීමට තීරණය කළෙමි. ඉන්පසුව 2013.02.13 දිනැතිව ස්ථාන මාරුවක් ලබා දී ඇති බවත් එම ලිපිය මත ඉල්ලුම්කරුට ඒ සම්බන්ධයෙන් නැවත දැනුම්දීමක් සිදුකර ඇති බවත් එය 2013.02.15 දාතමින් නිකුත් කර ඇති බවත් එය දැනටමත් මෙම බේරුම්කරණයේ R1 ලෙස සලකුණු කර ඇති බවත් සාක්ෂි දෙමින් පවසා සිටින ලදී. තව ද, ඉන්පසුව එම ස්ථාන මාරුවීම අවලංගුකර ලිපියක් නිකුත් කර ඇති බව ද සාක්ෂි ලබා දුන් අතර අදළ ලිපිය R10 ලෙසට සලකුණු කරන ලදී. තව ද, මෙම ඉල්ලුම්කරුට එරෙහිව නැවත චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති බවත් සාක්ෂි ලබා දුන් අතර චෝදනා පත්‍රය R11 ලෙස සලකුණු කරන ලදී. එම චෝදනාව සම්බන්ධයෙන් ද ඉල්ලුම්කරු වරදකරු කර දඬුවමක් ලෙස දින 7ක වේතන දඩ වශයෙන් අයකරගෙන ඇති බව ද සාක්ෂි ලබා දෙන ලදී. එම දඬුවම්දීමේ ලිපිය R12 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි දෙමින් තමන් ඇතුළු නිලධාරීන් විසින් සකස්කර ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාව R13 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමේ ලිපිය R14 ලෙසටත් චෝදනා පත්‍රය R15 ලෙසටත් සලකුණු කරන ලදී. තව ද, සහකාර මානව සම්පත් කළමනාකරු විසින් 2013.05.10 දාතමින් යොමු කරන ලද සේවය තහනම් කිරීමේ ලිපිය පදනම් කර ගනිමින් බදුල්ල ප්‍රාදේශීය ප්‍රවාහන කාර්යාලයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තැන විසින් නිකුත් කරන ලද ලිපිය R16 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම ලිපිය අනුව පළමු පාර්ශ්වයේ රැකවරණ නිලධාරි විසින් මෙම ඉල්ලුම්කරු වෙත චෝදනා පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ වැඩ තහනම් කිරීමට ප්‍රථම බවට ගෙන එන ලද තර්කය මෙම ලිපියෙන් බිඳ වැටී ඇති බව ද නිරීක්ෂණය කළෙමි. මෙම චෝදනා සම්බන්ධයෙන් කරන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් පසු පනවන ලද විනය නියෝගය R17 ලෙසට සලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉන්පසුව ඉල්ලුම්කරු විසින් අභියාචනාවක් කර ඇති අතර එය ද නිශ්ප්‍රභ වී නැවත දඬුවම ක්‍රියාත්මක කරන ලද බවට ද කරුණු ඉදිරිපත් කරන ලදී. එකී අභියාචනා නියෝගය ද මෙම බේරුම්කරණය වෙත ඉදිරිපත් කර එම ලේඛනය R18 ලෙස සලකුණු කරන ලදී. දෙවැනි පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් 2019.02.05 දින (පිටු අංක 252 258 දක්වා) සාක්ෂි ලබාදුන් සහකාර විමර්ශන නිලධාරී සුජීව සම්පත් ජයසේකර යන අය විසින් සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ මෙහි පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කරු විනය ලිපිගොනු 12ක් අනවසරයෙන් ඩිපෝ භූමියෙන් පිටතට රැගෙන යාමේ දී ඩිපෝවේ ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත් බවත් ලිපිගොනු තමන්ට මූලික විමර්ශනය අවස්ථාවේ දී ආරක්ෂක අංශ විසින් ලබා දුන් බවත් ය.

පළමු පාර්ශ්වය වෙනුවෙන් හරස් ප්‍රශ්න විමසීමේ අවස්ථාවේ දී (2019.02.21 පිටු අංක 259 සිට 296 දක්වා) නියෝජිත වික්‍රමසිංහ මහතා විසින් සාක්ෂිකාර සුජීව සම්පත් ජයසේකර මහතාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කර ඇත්තේ R6, R11, R15 යන චෝදනා පත්‍ර නිවැරදි විනය බලධරයා අත්සන් නොකිරීම සම්බන්ධයෙන් හා එම චෝදනා පත්‍රයේ අංකනයෙහි ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සහ දඬුවමක් වශයෙන් ලබා දී ඇති මූල්‍යමය දඬුවම වැරදි බවට ගෙන ආ තොරුතුරු පමණි. එම දඩ මුදල් අය කිරීම මෙම ප්‍රශ්නගත චෝදනාවලට කිසිසේත් සම්බන්ධ කරුණක් නොවන බව ද සැලකිල්ලට ගතිමි. කිසිඳු අවස්ථාවක පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුට එරෙහිව තිබූ අනවසරයෙන් ඩිපෝ භූමියට ඇතුළත් වී විනය ලිපිගොනු 12ක් අනවසරයෙන් ගෙනයාමට තැත් කිරීම හෝ එසේ තැත්කිරීමේ දී ඒවා

අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කිසිඳු ප්‍රශ්න කිරීමක් කර නොමැති අතර අනෙකුත් චෝදනා සම්බන්ධයෙන් ද හරස් ප්‍රශ්නවලට ලක් නොකර බව පෙනී යයි. තව ද, පළමු පාර්ශ්වය වශයෙන් ලේඛන සලකුණු කරනු ලැබුවේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ ''සී'' උපලේඛනය A14 ලෙසද, ඉහත විනය ව්‍යවස්ථාවේ 34 පිටුව A14 (ඒ) ලෙසද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාවේ 6 පිටුවේ කොටසක් A15 වශයෙන් ද, ලේඛන ලකුණු කරමින් සිය හරස් ප්‍රශ්න අවසන් කරන ලදී.

2019.03.05 දින දෙවැනි පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් දැනට දෙහිඅත්තකණ්ඩිය ඩිපෝවේ සේවය කරන අදාළ සිද්ධිය සිදුවූ අවස්ථාවේ දී බිබිල ඩිපෝවේ සේවයේ යෙදී සිටි ආරක්ෂක රැකවල්කරුවන කේ. එම්. සුදේශ් නාලක මහතා සාක්ෂියට කැඳවනු ලැබීය. ඔහු සාක්ෂි දෙමින් මෙම සිද්ධිය එනම් පළමු පාර්ශ්වය විසින් සිදුකළා යැයි චෝදනා ලැබ තිබෙන සිද්ධිය සිදුවූයේ 2013 වර්ෂයේ දී යැයි ප්‍රකාශ කළ ද කිසිඳු අවස්ථාවක මාසයක් හෝ දිනයක් සඳහන් නොකිරීම පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. පළමු පාර්ශවයේ ඉල්ලුම්කාර ආරියපාල මහතා පොලිතීන් බෑග් දෙකක ලිපිගොනු 12ක් හෝ 13ක් පමණ අනවසරයෙන් ගෙන යාමේදී එම ලිපිගොනු අත්අඩංගුවට ගත් බවත් තමන් සමග සේවයේ යෙදී සිටි සාහිර් මහතා විසින් ඒ පිළිබඳව ලොග් සටහනක් තැබූ බවත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කරනු ලැබුවා. එම ලොග් සටහන R 19 ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලද අතර, අදාළ විනය පරීක්ෂණයේ දී මෙම සාක්ෂිකරු විසින් සාක්ෂි ලබාදුන් ලේඛනවල පිටු අංක 59, 60, 61 සහ 62 යන කොටස් R 20 වශයෙන් සලකුණු කරමින් ප්‍රශ්න කරන ලදී. මෙහිදී ලකුණු කරන ලද R 19 ලේඛනය එනම් ලොග් සටහන තැබූ සාහිර් මහතා එම ලේඛනයේ අත්සන් තබා නොමැති බවට අධිකරණය විසින් කරන ලද ප්‍රශ්න කිරීම්වලදී හෙළි විය. (පිටු අංක 297 සිට 312)

පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත වික්‍රමසිංහ මහතා සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසමින් R 19 ලොග් සටහන සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ලද අතර එම ලේඛනයේ අත්සන් තබා ඇත්තේ තමා පමණක් බවත් එසේ අත්සන් තැබුවේ සාහිර් මහතා විසින් කරන ලද සටහන නිවැරදි බව සනාථ කිරීමට බවත් පෙන්වා දුන්න ද අදාළ ලොග් සටහන් යෙදූ සාහිර් නැමැත්තා එම ලොග් සටහනේ අත්සන් තබා නොමැති බව පිළිගන්නා ලදී. තව ද, මෙම ලොග් සටහනේ පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ අත්සනක් නොමැති බව ද, සාක්ෂිකරු පිළිගන්නා ලදී. එසේම මෙහිදී මෙම ලොග් සටහනෙහි අදාළ ලිපිගොනු පිළිබඳ කිසිඳු නිශ්චිත සටහනක් නොතිබීම පිළිබඳව ද සැලකිල්ල යොමු කෙරුවෙමි. මන්දයත් යම්කිසි ලේඛනයක් අත්අඩංගුවට ගත්විට ඒ පිළිබඳව නිවැරදි පැහැදිලි සටහනක් තැබීම ආරක්ෂක අංශයේ වගකීම හා සිරිත වන බැවිනි. එබැවින් දෙවැනි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද මෙම සාක්ෂිය පිළිගත හැකි ප්‍රමාණවත් සාක්ෂියක් නොවන බවට තීරණය කරමි. (පිටු අංක 312 සිට 327)

ඉන්පසු දෙපාර්ශවය විසින්ම තම නඩුව අවසන් කර ඇති බැවින් 2019.03.19 දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී ලිඛිත දේශන සඳහා දින ලබා දෙන ලදී. දෙපාර්ශවය විසින් ම තම ලිඛිත දේශන ලබාදීම බොහෝ සේ ප්‍රමාද කරන ලද අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින්ම තම ලිඛිත දේශන සඳහා නැවත දින අයැද සිට ඇත. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් 2019.05.13 දින ඒ 1 සිට ඒ 15 දක්වා ලේඛන ද අමුණමින් තම ලිඛිත දේශනය ද, දෙවැනි පාර්ශ්වය විසින් 2019.05.03 වැනි දින ද සිය ලිඛිත දේශන අදාළ ලේඛන R1 සිට R 20 දක්වා ලේඛන ද සමඟ ඉදිරිපත් කරන ලදී. තව ද, දෙවැනි පාර්ශ්වය විසින් තම අවසාන ලිඛිත දේශනවල සටහන් කර තිබූ නඩු තීන්දු පිටපත් ලබාදීම බොහෝ සෙයින් ප්‍රමාද කරන ලද අතර, එකී නඩු තීන්දු හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නිකුත් කරන ලද නීති ග්‍රන්ථයක දක්වා ඇති කරුණු අනුව නඩු තීරණ කිහිපයකට අදාළ කරුණු පමණක් 2019 ජූලි මස 03 වැනි දින ඉදිරිපත් කර ඇති අතර එම ප්‍රමාදය මෙම බේරුම්කරණ ප්‍රදානය ලබාදීමට යම් ප්‍රමාදයක් සිදුවීමට බලපාන ලදී.

මෙම සියලුම කරුණු සලකා බැලීමේ දී දෙවැනි පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුට එරෙහිව නගා තිබූ පළමු චෝදනාව වූ 2013.02.18 දින සිට වයඹ ප්‍රාදේශිකයට ස්ථාන මාරු කර තිබියදීත් 2013.02.17 දින අනවසරයෙන් ඩිපෝ භූමියට ඇතුළු වී බිබිල ඩිපෝවට අයත් ලිපිගොනු 12ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක් වංචනිකව ඩිපෝ භූමියෙන් පිටතට ගෙන යාමට තැත් කිරීම යන්න දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිවලින් තහවුරු කර නොමැති බව තීරණය කරමි. ඒ සම්බන්ධයෙන් ලබා දුන් එකම සාක්ෂිය වූ ආරක්ෂක රැකවල්කරු සුදේශ් නාලක මහතාගේ සාක්ෂි මගින් ඒ බව තහවුරු කිරීමට අපොහොසත් වී ඇත. එහෙත් මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු 2013.02.17 දින ඩිපෝ භූමියට ඇතුළු වී ගොනු සමග කටයුතු කළ බවට පැහැදිලි සාක්ෂි ඇති අතර ඉල්ලුම්කරු ද ඒ තත්ත්වය පිළිගෙන ඇත. තමන්ට ස්ථාන මාරුවක් ලැබුණ බව ආරංචි වී තමන් ලිපිගොනු භාරදීමට පැමිණි බව පළමු පාර්ශ්වය විසින් දිගින් දිගටම කරුණු දක්වා සිටීම මගින් මෙදින ගැටලුකාරී රාජකාරියක මෙම ඉල්ලුම්කරු නිරත වී සිටි බවද, පළමු පාර්ශ්වයේ නියෝජිත විසින් ද පිළිගෙන ඇති බව 2018.07.19 දින පිටු අංක 49 සාක්ෂි සටහන්වලින් තහවුරු වේ. මේ අනුව මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් යම් වරදක් සිදුකළාය යන්න බැහැර කළ හැකි කරුණක් නොවේ.

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත නගා ඇති දෙවැනි චෝදනාව වන්නේ පළමු පාර්ශ්වයට පවරා තිබූ වගකීම් අතර ධා. 15 චෝදනා පත්‍රවලට නිසි විනය ක්‍රියාමාර්ගය ගැනීම සිදු නොකර ඔහුගේ වගකීම් හිතාමතා පැහැර හැරීම යන්න වේ. මේ සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින්ම තමන් විසින් එම වගකීම පැහැර හැර ඇති බව පිළිගෙන ඇති අතර දෙවැනි පාර්ශ්වය විසින් ද එම

කරුණ තහවුරු කර ඇත. එය බිඳ හෙළීමට කිසිම අවස්ථාවක පළමු පාර්ශ්වය කටයුතු සිදුකර නොමැත. තවද, 2018.05.09 දිනැති ඉල්ලුම්කරුගේ සාක්ෂිවලින් ගොනුවේ 46 පිටුවෙහි තමන් දෙවැනි චෝදනාවට වරදකරු බවට සාක්ෂිකරු පිළිගෙන තිබේ. එහෙත් තවත් අවස්ථාවක තමන් සියලුම චෝදනාවලට නිවැරදිකරු බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරු විසින් පරස්පර විරෝධී සාක්ෂි ලබාදීමෙන් ඔහුගේ සාක්ෂිවල විශ්වසනීයත්වය කෙරෙහි සැක සංකා මතුකර ඇත. තවද, දෙවැනි පාර්ශ්වය විසින් සලකුණු කරන ලද R3d ලේඛනය කිසිදු අවස්ථාවක පළමු පාර්ශ්වය විසින් අභියෝගයට ලක්කර නැති අතර එම සාක්ෂි බිඳ හෙළීමට කිසිදු අවස්ථාවක උත්සාහ කර නොමැත. ඒ අනුව එම චෝදනාවට පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වරදකරු වන බව පැහැදිලි සාක්ෂි ඇති බැවින් එම දෙවැනි චෝදනාවට පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වරදකරු බව තීරණය කරමි.

ඉන්පසු චෝදනා කර ඇත්තේ,

විධායක නිලධාරියෙකු ලෙස මණ්ඩලය පළමු පාර්ශ්වය පවරන ලද රාජකාරිය විශ්වාසදායකව කාර්යක්ෂමව ඉටු කිරීම පැහැර හැරීම.

ඉහත චෝදනා අනුව කටයුතු කිරීමෙන් පළමු පාර්ශ්වය අනෙකුත් සේවකයන්ට වැරදි පූර්වාදර්ශයක් සැපයීම.

ඉහත චෝදනා අනුව කටයුතු කිරීමෙන් පළමු පාර්ශ්වය තවදුරටත් මණ්ඩලයීය සේවයට නුසුදුස්සකු වීම.

යන චෝදනා වේ. මෙම චෝදනා පළමු පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර එම චෝදනා පිළිබඳව දෙවැනි පාර්ශ්වය සාක්ෂි මෙහෙයවීමේ දී අවධානය යොමුකර නොමැත. කෙසේ වෙතත් දෙවැනි චෝදනාවට වරදකරු වීමෙන් නිතැතින්ම ඔහු තෙවැනි හා සිව්වැනි චෝදනාවලට ද වරදකරු වීම වැළැක්විය හැකි කරුණක් නොවේ. මන්ද යත් දෙවැනි චෝදනාව හා සබැඳිව තෙවැනි හා සිව්වැනි චෝදනාවන් ගොනුකර ඇති බැවිනි. එහෙත් පස්වැනි චෝදනාවට ඔහු වරදකරු බව ඔප්පු කිරීමට නොහැකි වී ඇති අතර එය ශ්‍රී ලංකා ගමනාගමන විනය ව්‍යවස්ථාව අනුව චෝදනාවක් නොවන බවද පැහැදිලි වේ.

පළමු පාර්ශ්වය විසින් වරදක් සිදුකර ඇති බව ඉතා පැහැදිලි වේ. එම වරද තමා විසින් කළ බවට දෙවැනි පාර්ශ්වය විසින් ගෙන එන ලද කරුණු හා සාක්ෂි මෙහෙයවීම් බිඳ හෙළීමට කිසිම අවස්ථාවක පළමු පාර්ශ්වය කටයුතු සිදුකර නොමැත. පළමු පාර්ශ්වය දිගින් දිගටම උත්සාහ ගෙන ඇත්තේ චෝදනා පත්‍ර, වැඩ තහනම් කිරීමේ ලිපි, විනය නියෝග, අභියාචනා නියෝග අත්සන් කර ඇති පුද්ගලයන් නිසි බලධරයන් නොවන බවට ඔප්පු කිරීමට වේ. ඒ බවට කිසිදු අවස්ථාවක දෙවැනි පාර්ශ්වය විරෝධතාවයක් දක්වා නොමැත. මෙම කරුණු ඇත්ත වශයෙන්ම තාක්ෂණික කරුණු විනා චෝදනා සම්බන්ධයෙන් ඒවා බිඳහෙළීමට අදාළ කරුණු නොවන බව ද සැලකිල්ලට ගනිමි. තවද සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලබාදීමේ දී ඉල්ලුම්කරුගේ කැමැත්ත ලබා ගත යුතු ය යන්න පිළිබඳව ඉල්ලුම්කරු තමාගේ කැමැත්ත ලබා දුන් බව ද සාක්ෂිවලින් තහවුරු කර ඇත.

කෙසේ වෙතත් පළමු පාර්ශ්වය විසින් A3a වශයෙන් සලකුණු කර ඇති චෝදනා පත්‍රයෙන් චෝදනා කර ඇති චෝදනා කිහිපයකට වරදකරු බවට තහවුරු වී ඇති බැවින් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් වරදක් සිදුකර ඇති බවට කිසිදු සැකයක් නොමැතිව තහවුරු වී ඇත. මෙසේ වරදක් සිදුකරන ලද සේවකයකුට දඬුවමක් නොකිරීම මගින් අනිකුත් සේවකයන්ට ද එය වැරදි පූර්වාදර්ශයක් වීම වැළැක්විය නොහැකිය. ඉහත කරුණු සියල්ලම සලකා බලා මාගේ ප්‍රදානය ලබා දෙමි.

### ප්‍රදානය

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් වරදක් සිදුකර ඇති බවට තහවුරු වී ඇති බැවින් ද, සිදුකර ඇති වරද පිළිබඳව සැලකිල්ලට ගනිමින් ද, ඔහු විසින් ඉල්ලන ලද සහන ලබා දීමට මෙම බේරුම්කරණයට පිළිගත හැකි ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීමට පළමු පාර්ශ්වය අපොහොසත් වී ඇති අතර, දෙවැනි පාර්ශ්වය විසින් මෙම ඉල්ලුම්කරු චෝදනා කිහාපයකටම වරදකරු බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර ඇති බැවින් ද ඉල්ලුම්කරු විසින් ඉල්ලන ලද සහන ලබා දීමට තරම් ප්‍රබල සාක්ෂි නොමැති බැවින් ද, ඉල්ලුම්කරු වෙනුවෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් දක්වා ඇති ආරවුලට හේතු වූ කරුණු සම්බන්ධයෙන් සහනයක් ලබාදීම ප්‍රතික්ෂේප කරමි. මෙය සාධාරණ සහ යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු

2019 ජූලි මස 09 වැනි දිනදී ය.

08-653

මගේ අංකය: IR/15/15/2010.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 දිනැති හා අංක 1709/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කඩවත, ඇල්දෙනිය, මනෝරම්‍ය වත්ත, අංක 21/1, හි පදිංචි ඩී. එම්. ජයන්ත මයා සහ කොළඹ, ලේක්හවුස්, තැ. පෙ. 248 හි පිහිටි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/15/15/2010.

## කාර්මික අධිකරණයේ දී ය.

ඩී. එම්. ජයන්ත මහතා,
අංක 21/1, මනෝරම්‍ය වත්ත,
ඇල්දෙනිය,
කඩවත.
(*පළමු පාර්ශවය*)

නඩු අංකය : A 3389

සහ

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
තැ. පෙ. 248, ලේක්හවුස්,
කොළඹ.
(*දෙවන පාර්ශවය*)

*අතර පවතින කාර්මික ආරාවුල*

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2011.06.03 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට හේතු වී ඇති කාරණය* :

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ඡායාරූප කර්තෘවරයෙකු වශයෙන් සේවය කර විශ්‍රාම ලැබූ ඩී. එම්. ජයන්ත මහතාට එම සමාගම විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබූ 2002.01.16 දිනැති ලිපිය අනුව 2001.12.28 දින සිට බලපවත්නා පරිදි ලබාදීමට නියමිත වැටුප් වැඩිවීම නොගෙවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද?'' යන්න පිළිබඳව වේ.

*පෙනී සිටීම* :

මෙම නඩුවේ පළමුවැනි පාර්ශවය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන ඩී. එම්. ජයන්ත මහතා (ඇතැම් තැනෙක ජයන්ත දිවිසේකර) නඩු කටයුත්ත පුරා ම ඊට සහභාගි විය. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණ විභාගය ආරම්භ වී පරීක්ෂණ වාර අටක් දක්වා පළමුවැනි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටියේ බලය පවරනු ලැබූ නියෝජිත විල්බට් පෙරේරා මහතා ය. 2012.05.15 දින පැවති විභාගයෙන් පසු ව එකී විල්බට් පෙරේරා මහතා මියගොස් ඇති බැවින් 2012.07.09 සහ 2012.07.26 දින පැවති පරීක්ෂණයන්ට පළමුවැනි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටියේ බලය පවරනු ලැබූ නියෝජිත ටී. පී. උපාලි කුලරත්න මහතාය. 2013.07.26 වැනි දින සිට මෙම බේරුම්කරණ විභාගය අවසන් වන දින තෙක් පරීක්ෂණ වාර කීපයක දී හැරුණු විට පළමුවැනි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටියේ නීතිඥ දිශාන් ධර්මසේන මහතා ය.

දෙවැනි පාර්ශවයේ ආයතනය වෙනුවෙන් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ නියෝජ්‍ය ප්‍රධාන පරිපාලන නිලධාරී ජී. එච්. එස්. බාලචන්ද්‍ර මහත්මිය සහ නීති නිලධාරිනි සුදර්ශී හේවාවසම් මහත්මිය වාර කීපයක දී හැරුණු විට දෙවැනි පාර්ශවය වෙනුවෙන්, බේරුම්කරණ විභාගය පුරාවට ම සහභාගී විය. බේරුම්කරණ විභාගය කැඳවන ලද දෙවැනි දිනයේ එනම් 2011.10.23 වැනි දින සිට දෙවැනි පාර්ශවය වෙනුවෙන් වාර කීපයක දී හැරුණු විට දෙවන පාර්ශවය වෙනුවෙන් හාම්පුතුන්ගේ සංගමය නියෝජනය කරමින් පෙනී සිටියේ නීතිඥ ඩී. එස්. දිසානායක මහතා ය. වරින් වර දින කීපයක දී ආයතනයේ සහකාර ප්‍රධාන පරිපාලන නිලධාරී ජී. එච්. සෝමලතා මහත්මියත්, බී. ජී. ප්‍රශිකා මහත්මියත්, නීතිඥ කුමුදු හේමනී ගුණවර්ධන මහත්මියත්, නීති නිලධාරිනි ඉරෝමි ජයවර්ධන මහත්මියත් දෙවැනි පාර්ශවය වෙනුවෙන්, බේරුම්කරණ විභාගයට සහභාගි විය.

*නඩු පටිපාටිය* :

මෙම නඩුව 2011.08.26 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශවයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශවයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශවය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. බේරුම්කරණ විභාගය 2011 අගෝස්තු මස 26, ඔක්තෝබර් මස 13, නොවැම්බර් මස 09, 2012 අප්‍රේල් 19, මැයි 15, ජූලි 09, ජූලි 26, අගෝස්තු 29, 2013 ජුනි 06, ජූලි 30, ඔක්තෝබර් 29, දෙසැම්බර් 02, 2014 පෙබරවාරි 06, මාර්තු 18, මැයි 20, ජුනි 18, සැප්තැම්බර් 16, 2015 මැයි 13, ජූලි 28, නොවැම්බර් 09, දෙසැම්බර් 23, 2016 මාර්තු 03 සහ මැයි 20 යන දිනයන් 23 ක දී විභාගය පවත්වන ලදී. දින නියම කොට විනිශ්චයාධිකාරිය රැස් වූ නමුත් පාර්ශවකරුවන්ගේ පෙනී නොසිටීම, විභාගයට සූදනම් නොවීම වැනි හේතූන් මත 2012 ජනවාරි 12, පෙබරවාරි 16, මාර්තු 15, 2013 ජනවාරි 18, මැයි 09, සැප්තැම්බර් 16, 2014 ජනවාරි 08, 2015 ජනවාරි 28 යන දිනයන් අටෙහි දී පරීක්ෂණ විභාගය පැවැත්වීමට නොහැකි ව කල්තැබීම කරන ලදී. තවද, දින නියම කරන ලද නමුත් 2012 මාර්තු 13, ජුනි 05, 2014 අගෝස්තු 19, ඔක්තෝබර් 30, 2015 මාර්තු 19, ජුනි 11, අගෝස්තු 27, 2016 ජනවාරි 26 සහ අප්‍රේල් 08 යන දිනයන් නවයෙහි දී කලින් දැනුම්දීම මගින් පරීක්ෂණ විභාගය රැස් නොවී කල් තබන ලදී.

මෙම බේරුම්කරණ විභාගය ඉතා දීර්ඝ කාලයක් ගත වුව ද වාචික සාක්ෂි මෙහෙයවනු ලැබුවේ සාක්ෂිකරුවන් තිදෙනෙකුගෙන් පමණි. පළමුවැනි පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු ජයන්ත මහතාගේ සාක්ෂිය මෙහෙයවන ලද අතර, දෙවන පාර්ශවය වෙනුවෙන් එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ නියෝජ්‍ය ප්‍රධාන පරිපාලන නිලධාරී ජී. එච්. එස්. බාලචන්ද්‍ර මහත්මියගේ සහ එහි සමාගම් ලේකම් නීතිඥ කුමුදු හේමනී ගුණවර්ධන මහත්මියගේ සාක්ෂි මෙහෙයවන ලදී.

මේ අතර පරීක්ෂණය ඉදිරියට පවත්වාගෙන යාමට අගතියක් නොවන පරිදි හැකි සෑම අවස්ථාවකදී ම දෙපාර්ශවය එකඟ වන කිසියම් සමථයක් සඳහා එළඹීමට ඇති හැකියාව සළකා බලන ලද නමුත් ඒ සඳහා එකඟතාවක් ඇති කර ගැනීම අපහසු කාර්යයක් විය.

සාක්ෂි විභාගය අවසන්වීමෙන් පසුව නියම කරන ලද පරිදි පළමුවන පාර්ශවය විසින් පරීක්ෂණයේ දී ලකුණු කරන ලද A1 සිට A15 දක්වා වූ ලේඛන ද සමග අවසන් ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කර ඇති අතර, දෙවන පාර්ශවය විසින් පරීක්ෂණයේ දී ලකුණු කරන ලද R1 සිට R37 දක්වා වූ ලේඛන ද සමග අවසන් ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කර ඇත.

*නිරීක්ෂණ සහ නිර්දේශ* :

මෙම බේරුම්කරණ විභාගයට අදාළ ව කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යතුමා විසින් මා වෙත යොමු කරන ලද යොමුවේ සඳහන් කර ඇති කාර්මික ආරවුල පහත දැක්වෙන ලෙස විසඳිය යුතු මූලික කරුණු වශයෙන් විශ්ලේෂණය කළ හැකිය.

1. සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ඡායාරූප කර්තෘවරයෙකු වශයෙන් සේවය කර විශ්‍රාම ලැබූ ඩී. එම්. ජයන්ත මහතාට එම සමාගම විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබූ 2002.01.16 දිනැති ලිපිය අනුව 2001.12.28 දින සිට බලපවත්නා පරිදි ලබාදීමට නියමිත වැටුප් වැඩිවීම නොගෙවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේද?

2. අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද?

මෙම බේරුම්කරණ විභාගයට අදාළ පළමුවන පාර්ශවය වන සහනයන් ඉල්ලා සිටින ඩී. එම්. ජයන්ත (ඇතැම් තැනෙක ජයන්ත දිවිසේකර යන නමින් හැඳින්වේ) යන අය ඡායාරූප මුද්‍රණකරුවෙකු වශයෙන් 1973.06.01 දින එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සේවයට බැඳී ඇත. ඔහු යම් යම් උසස්වීම් ද ලබා 2008.04.03 දින දක්වා සේවයකොට විශ්‍රාම ලැබූ අතර, පසුව 2008.05.13 දින සිට 2008.11.14 දින දක්වා කොන්ත්‍රාත් පදනම යටතේ නැවත මාස 06 ක පමණ කාලයක් සේවය කර ඇත.

මෙම ආරවුලට පදනම් වන ප්‍රධානතම ප්‍රස්තුතය මතුවන්නේ තත්කාලයේ පැවති ආයතනයේ කර්තෘ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන පරිපාලන නිලධාරිගේ අත්සනින් යුතුව මූල්‍ය කළමනාකරුට පිටපතක් සහිතව 2001.12.28 වැනි දින දරන ලිපියක් (A1 ලෙස ලකුණු කළ) මගින් මෙහි සහනයන් පතන ඩී. එම්. ජයන්ත මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි ආයතනයේ ඡායාරූප දෙපාර්තමේන්තුවේ ඡායාරූප කර්තෘ වශයෙන් පත්කරන ලද බව දන්වා එවනු ලැබීමෙනි. එම ලිපියට ම සම්බන්ධතාව ඇති ව ආයතනයේ කර්තෘ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරිපාලන නිලධාරිගේ අත්සනින් යුතුව, අංශ තුනකට පිටපත් ද සහිත ව, 2002.01.16 වැනි දින දරන ලිපිය (A3 ලෙස ලකුණු කළ) මගින් ඔහු 2001.12.28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙරදාතම්කොට ආයතනයේ රු. 14140/= - රු. 25590/= (5 × 1030/=, 5 × 1260)/= හිමි A ගණයේ 2 ශ්‍රේණියේ වැටුප් පරිමාණයට උසස්කොට එකී වැටුප් පරිමාණය ඇතුළත රු. 21,810/= මාසික වැටුප් තලයේ පිහිටුවන බවත් තවත් දීමනාවන් සඳහා හිමිකම් ලබන බවත් දන්වා ඇත.

දෙපාර්ශවය විසින් මෙහෙයවන ලද වාචික සාක්ෂි සහ ලකුණුකොට ඉදිරිපත් කරන ලද ලේඛන ඉතා සියුම් ලෙස පරීක්ෂා කිරීමේදී ගොඩනැගෙන විස්තරය වන්නේ 2001 වර්ෂය අගභාගය වනවිට එනම් 2001 නොවැම්බර් මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සභාපති ධූරයට කුමාර් අබේසිංහ මහතා පත්වූ බවත් ඔහු විසින් අත්තනෝමතික ලෙස අභ්‍යන්තර උසස්වීම් රාශියක් කළ බවත් ජයන්ත මහතාට දෙන ලද උසස්වීම ද ඒවා අතර වූ අවිධිමත් උසස් කිරීමක් බව දෙවන පාර්ශවය මතුකොට පෙන්වයි. R29 ලෙස ලකුණු කළ ලේඛනය ඉදිරිපත් කරමින් දෙවන පාර්ශ්වය උත්සාහ ගත්තේ එය එකී කුමාර් අබේසිංහ නමැති සභාපතිවරයා විසින් මෙමෝ සටහනක් මගින් ජයන්ත මහතා ඡායාරූප කර්තෘ වශයෙන් පත්කිරීම අනුමත කරමින් දෙන ලද හිතුවක්කාර නියෝගයක් බව තහවුරු කිරීමටය. එකී සභාපති කුමාර් අබේසිංහ මහතාගේ නියෝගය පරිදි ජයන්ත මහතාට 2001.12.28 සහ 2002.01.16 දිනැති ලිපිවලින් උසස්වීම තහවුරුකොට එවනු ලැබූ නමුත්, ඒ එක්කම වාගේ ඔහු වෙනුවට සභාපති ධූරයට නලින් ලද්දුවහෙට්ටි මහතා පත්කරනු ලැබිණි. ඉන්පසුව නලින් ලද්දුවහෙට්ටි නව සභාපතිවරයාගේ සභාපතිත්වය යටතේ 2002.02.14 දින පැවති එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී එකී පත්වීම් අනුමත කර නැත. එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ උධෘතයක් R8 වශයෙන් දෙවන පාර්ශ්වය විසින් ලකුණු කරනු ලැබ ඇති අතර ඉන් කියැවෙන්නේ හිටපු සභාපතිවරයා විසින් අත්තනෝමතික ලෙස කර ඇති උසස්කිරීම් පිළිබඳව සැළකිල්ල යොමුකළ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා ඇත්තේ එකී උසස්කිරීම් සිදු කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතියක් ලබාගැනීමෙන් තොරව බවයි. එම කාරණය සම්බන්ධයෙන් සම්පූර්ණ වශයෙන් සළකා බැලීම යෝග්‍ය බැවින් ඒවා ඒ අවස්ථාවේ දී අනුමත නොකිරීමට තීරණය කර ඇත. කෙසේ වුවත් අදාළ සේවක පිරිස අවසන් තීරණයක් ගන්නා තෙක් උසස් කරනු ලැබූ ඒ ඒ තනතුරුවල වැඩ බැලීමට පත් කිරීමට ද තීරණය කර ඇත. ඔවුන් පෙර දැරූ තනතුරුවල වැටුප් දිගටම ලැබිය යුතු බවටත්, එකී වැඩබලන තනතුරු හොබවන තෙක් වැඩබැලීමේ දීමනාවන්ට හිමිකම් ලැබිය යුතු බවටත් තීරණය කරනු ලැබ ඇත. මේ අනුව මෙම ඉල්ලුම්කරුට රු. 2,490/= ක මාසික වැඩ බැලීමේ දීමනාවක් අනුමත කරනු ලැබ ඇත. වැඩිදුරටත් මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කියා සිටින්නේ එම පත්වීම් පිළිබඳව ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සළකා බලනු ලබන බවයි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පදනම් කරගෙන ජයන්ත මහතාට 2001.12.28 සහ 2001.01.16 දිනයන් සහිතව නිකුත් කරන ලද ලිපිවලින් දෙන ලද වැටුප් වැඩිවීමේ හිමිකම අවුරා තබා ඒ වෙනුවට රු. 2,490/= ක් බැගින් වූ වැඩ බැලීමේ දීමනාවක් ලබාදී ඇති බවයි.

මෙහිදී බේරුම්කරණය නිරීක්ෂණය කළ වැදගත් කරුණක් වනුයේ ඔහුට ලබාදී තිබුණු තනතුරු උසස්වීම වෙනසකට භාජනය කර නොමැති බවයි. ඒ බව R8 ලෙස ලකුණු කළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ පද විග්‍රහ කිරීමෙන් පැහැදිළිවේ. එසේ ම උසස් කරන ලද තනතුර වෙනස් කරනු ලැබුවේ නම් ඔහුට ඒ බව දැනුම් දිය යුතුවා මෙන්ම පෙර දැරූ තනතුරට ආපසු හරවා යැවිය යුතුවේ. එවැන්නක් සිදුවූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර ඒ පිළිබඳ කිසිදු හබයක් ද සිදු නොවීය. ඒ අනුව පැහැදිළි වන්නේ කුමාර් අබේසිංහ සභාපතිවරයාගේ ආශීර්වාදයෙන් ඉල්ලුම්කරු ජයන්ත මහතාට ලැබුණු තනතුරු උසස්වීම එපරිද්දෙන්ම තිබියදී උසස් කරන ලද තනතුරට අදාළව පිහිටවනු ලැබූ වැටුප ලබානොදී උසස්වීම කරණකොට ගෙන ලැබිය යුතු වූ මාසික රු. 5,100/ ක වැටුප් වාසිය අහිමිකොට ඉන් අඩක් පමණ වන රු. 2,490/= ක් වන වැඩබැලීමේ දීමනාවක් ලබාදී ඇති බවයි.

අනෙක් අතට එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මෙම කාරණය පිළිබඳව අවසාන තීරණයක් ගනු ලැබූ එකක් නොවේ. එම වැටුප් වැඩිකිරීම ඒ අවස්ථාවේ අත්හිටවිය යුතු එකක් ලෙස සැළකූ බවත්, පසුව ගැඹුරෙන් සළකා බැලිය යුතු එකක් බවත්, ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී නැවත සළකා බලන බවත් කියැවෙන්නකි. කරන ලද තනතුරු උසස්වීම අත්හිටුවීමේ කිසිදු තීරණයක් ඉන් ගෙන නැත.

බේරුම්කරණය නිරීක්ෂණය කළ තවත් ඉතා වැදගත් කරුණක් වනුයේ එකී තීරණය සේවකයාගේ තිල තත්ත්වයට ඍජුව බලපාන කරුණක් බැවින් එය ඔහුට දැනුම් දිය යුතු බවයි. ඉහත සඳහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2012.02.14 දින ගනු ලැබුවත් ඉන් උදාවන තත්ත්වය ඉන් ඍජු බලපෑමට ලක්වන සේවකයා වන ජයන්ත මහතාට දැනුම් නොදීමෙන් පාලනාධිකාරිය බලවත් අඩුපාඩුවක් සිදු කර ඇත. එය වෙනත් අතකින් බැලුවොත් එසේ දැනුම්දීමක් නොකළේ තවදුරටත් කරුණු සළකා බැලීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය ජයන්ත මහතාට පෙර කී වාසිය ලබාදීමේ චේතනාවක් ඇතිව සිටි නිසා විය හැකිදැයි ද සිතිය හැකිය. මුල්වරට තමාට හිමි උසස් කිරීමේ වැටුප ලබානොදී වැඩබැලීමේ දීමනාවක් දීම පිළිබඳව ජයන්ත මහතාට මුල්වරට ලිපියකින් (R7) දැනුම් දෙනු ලැබ ඇත්තේ 2004.09.01 දින දී ය. මෙය ප්‍රහේලිකාවක් වන්නේ දෙවන පාර්ශ්වය විසින්ම R30 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කළ අභ්‍යන්තර මැමය මගින් කර්තෘ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරිපාලන නිලධාරි විසින් ආයතනයේ මූල්‍ය කළමනාකරු අමතා එකී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට දැනුම් දීම නිසා ය. මෙම තත්ත්වය අදාළ සේවක මහතා වන ජයන්ත මහතාට දැනුම් නොදුන්නේ ඇයි ද යන්න මතු වන ගැටලුවයි. ඩී. එම්. ජයන්ත මහතාට 2001.12.28 සහ 2001.01.16 දිනයන් සහිතව නිකුත් කරන ලද ලිපිවලින් දෙන ලද වැටුප් වැඩිවීමේ හිමිකම 2002.02.14 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණයෙන් අවුරා තබා ඒ වෙනුවට රු. 2,490/= ක් බැගින් වූ වැඩ බැලීමේ දීමනාවක් ලබා දුන්නේ නම් පාලනාධිකාරිය කළ යුතුව තිබුණේ එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ ඉතිරි අංග ද ක්‍රියාත්මකකොට එකී තීරණයේ අවසානයක් කළ යුතුවීමයි. එසේ නොකිරීමෙන් ජයන්ත මහතාට අසාධාරණයක් සිදු වූ බව මාගේ විශ්වාසයයි.

තමාට ලබාදී තිබුණු වැටුප් වැඩිවීම අහිමි කිරීමට තුඩු දුන්නේ දේශපාලනික හේතූන් සහ පෞද්ගලික අමනාපකම්බව සාක්ෂි දෙමින් ඉල්ලීම කරන ජයන්ත මහතා පුන පුනා කරුණු දැක්වීය. දිගින් දිගටම A14, A15 ලේඛන ලකුණු කරමින් සහ ආයතනයේ සාක්ෂිකරුවන් දැඩි පීඩනයකට පත්කරමින් පළමුවන පාර්ශ්වය විසින් උත්සාහ දැරුවේ ජයන්ත මහතා දේශපාලන වශයෙන් එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ කෙනෙකු බවත්, එම දේශපාලන පක්ෂයට අනුබද්ධිත ජාතික සේවක සංගමයේ නිලධාරියෙකු බවත් ඒ නිසා ඔහුට දේශපාලන පලිගැනීම් ඇතිවුන බව තහවුරු කිරීමට ය. එම උත්සාහය ඵලදායි එකක් වීද යන්න සැක සහිත ය. 2001 නොවැම්බර් මාසයෙන් පසුව බලයේ සිටියේ එක්සත් ජාතික පක්ෂයේ රජයක් නිසාත්, කුමාර් අබේසිංහ මහතා මෙන් ම නලින් ලද්දුවහෙට්ටි මහතාත් පත් කරනු ලැබුවේ එකී පාලනය යටතේ වන නිසාත්ය. දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීම්වල 4 වැනි සහ 5 වැනි ඡේදවලින් ඒ බවට කරුණු ඉදිරිපත් කර ඇත. එම නිසා ජයන්ත මහතාට කුමාර් අබේසිංහ සභාපතිවරයාගේ ආශීර්වාදයෙන් ලැබුණු තනතුරු උසස්වීම සහ වැටුප් ප්‍රතිලාභය නලින් ලද්දුවහෙට්ටි මහතාගේ තීරණයකින් අහිමිවූයේ දේශපාලන පළිගැනීමක් නිසා බවට ඒත්තු ගැන්වීමට පළමුවැනි පාර්ශ්වය අසමත් විය.

අනතුරුව 2004.05.27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි (R20) එතෙක් ඔහු ලබමින් සිටි රු. 2,490/= ක් වූ මාසික වැඩබැලීම් දීමනාව නවත්වා දමන ලද අතර 2004.05.27 වැනි දිනැති ලිපියෙන් (R18) ඔහු දිනමිණ කර්තෘ අංශයටත්, 2004.10.08 දිනැති ලිපියෙන් (R19) ඡායාරූප දෙපාර්තමේන්තුවටත් ස්ථාන මාරුකොට ඇත. සාක්ෂි මෙහෙයවීමේ දී පවතින නිරවුල් භාවය අඩුකම නිසා පැහැදිළි නොවුව ද පළමුවැනි පාර්ශ්වයෙන් මෙම ක්‍රියාදාමයන් ජයන්ත මහතාට දේශපාලන හේතූන් මත සිදුවූ පාඩු ලෙස ඉදිරිපත් කිරීමේ වෑයමක් තිබුණු බව නිරීක්ෂණය විය.

කෙසේ වෙතත් 2006.07.01 සිට ජයන්ත මහතා රු. 28,260/= ක මාසික වැටුපකට ද, 2007.07.01 දින සිට රු. 31,585/= ක මාසික වැටුපකට ද හිමිකොට වැටුප් තලවල පිහිටුවා ඇත. බේරුම්කරණයේ ඉදිරිපත් වූ වාචික සහ ලේඛනගත සාක්ෂි අනුව 2001.12.28 දිනට රු. 21,810/= මාසික වැටුප් තලයේ පිහිටවනු ලැබුවේ නම් නියමිත වැටුප් වර්ධක ලැබීමෙන් 2006 ජූලි මාසය වන විට ලැබිය හැකිව තිබුණු වැටුප් තලය ඔහුට ලැබී ඇති බව නිරීක්ෂණය කරමි.

පළමුවන පාර්ශවයේ අවසන් ලිඛිත සැලකිරීම්වල දෙවැනි පිටුවේ ඉල්ලුම්කරු ඉල්ලා සිටින සහනය වන්නේ රු. 10,35810/-ක මුදලකි. එය ගණනය කර ඇති ආකාරය දක්වා නැත. ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි දීම අවසන් කරමින් කියා සිටියේ තමාට හිමි මුදල් ලබාගෙන ජීවිතයේ ඉතිරි කටයුතු කරගැනීමට අවශ්‍ය බවයි. 2012.05.15 දින කාර්ය සටහන් පිටු අංක 06 හි ඉල්ලුම්කරු මෙසේ සාක්ෂි දී ඇත.

''ප්‍ර. තමන් මේ අධිකරණයෙන් බලාපොරොත්තු වන සහනයන් මොනවා ද ?

උ. මම අවු. 04 කට කලින් විශ්‍රාම ගියා. මට ලැබිය යුතු මුදල් ලැබුණොත් මගේ ජීවිතයේ ඉතිරි කටයුතු කර ගැනීමට පුළුවන්.''

එදින ම එම කාර්ය සටහන් පිටුවේ ම දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කාර සාක්ෂිකරු මෙසේ කියා සිටී.

''ප්‍ර. තමන් මේ ගරු කාර්මික අධිකරණයෙන් බලාපොරොත්තු වන්නේ තමන් විශ්‍රාම ගියාට පසුව ජීවත් වීමට යම් කිසි මුදල් ගෙවීමක් බලාපොරොත්තුවනවා ද?

උ. 2001 වර්ෂයේ සිට විශ්‍රාම යන තෙක් මාස 95ක වැටුපක් ඉල්ලා සිටිනවා.''

මේ හැරුණු විට දෙවන පාර්ශ්වය විසින් R35 ලෙස ලකුණු කළ ජයන්ත මහතා විසින් 2008.05.26 දින ආයතනයේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ අමතා යවන ලද ලිපියකින් ඔහු 2002 ජනවාරි සිට 2008 දක්වා හිඟ වැටුප් වර්ධකය ඉල්ලා සිටී.

සියලු කරුණු සලකා බැලීමෙන් පසු ව, 2001.12.28 දිනට පෙර ලබමින් සිටි රු. 16,600/- වැටුපේ සිට රු. 21,810/- මාසික වැටුප් තලයේ පිහිටුවීමෙන් ඔහුට මාසික ව ලැබිය යුතු වූ රු. 5,210/- වැටුප් වැඩිවීම ජයන්ත මහතාට හිමි කළ යුතු බව මාගේ නිගමනයයි. කෙසේ වුව ද 2002 ජනවාරි මාසයේ සිට ඔහුට ගෙවන ලද රු. 2,490/- ක් බැගින් වූ වැඩ බැලීමේ දීමනාව ඉන් අඩු කළ යුතු වේ. තව ද එකී හිඟය ගෙවිය යුතු වන්නේ 2002 ජනවාරි මාසයේ සිට 2004 මැයි මාසය දක්වා පමණි. එකී වැඩ බැලීමේ දීමනාව ඉවත් කරනු ලැබ සිටි 2004 ජුනි සිට 2006 ජුනි මාසය දක්වා කාලයට ඔහුට එකී රු. 5,210/- මුළු වාසිය ම ගණනය කොට ලබාදිය යුතු වේ.

ඒ අනුව ගණනය කිරීම පහත පරිදි ය.

**2002 ජනවාරි සිට 2004 ජුනි දක්වා කාලයට :**

| | |
|---|---|
| හිමි වූ එහෙත් නොගෙවන ලද වැටුප් වාසිය | මසකට රු. 5,210/- |
| ගෙවන ලද වැඩ බැලීමේ දීමනාව | මසකට රු. 2,490/- |
| ඒ අනුව හිඟ ව ඇති මුදල | මසකට රු. 2,720/- |
| කාල පරිච්ඡේදය | මාස 30 |
| හිඟ මුදල | රු. 81,600/- |

**2004 ජූලි සිට 2006 ජුනි දක්වා කාලයට :**

| | |
|---|---|
| හිමි එහෙත් නොගෙවන ලද වැටුප් වාසිය | මසකට රු. 5,210/- |
| කාල පරිච්ඡේදය | මාස 24 |
| හිඟ මුදල | රු. 125,040/- |
| | |
| එකතුව | රු. 206,640/- |

ඉල්ලුම්කරුට දිය හැකි වෙනත් ප්‍රතිලාභයන් ඇතිදැයි නිගමනයකට එළඹීමට තරම් සාක්ෂි හෝ කරුණු බේරුම්කරණ විභාගයේ දී ඉදිරිපත් නොවීය. මේ වැටුප් වැඩිවීම එය අහිමි වූ කාලයේ ලැබුණේ නම් ඔහු විශ්‍රාම ගන්නා අවධිය වන විට ලැබිය යුතු වූ වැටුපෙහි වෙනසක් ඇතිවේ ද යන්න පිළිබඳ නිගමනයන්ට එළඹීමට තරම් සාක්ෂි හෝ කරුණු හෝ ගණනය කිරීම් ඉදිරිපත් වූයේ නැත. මේ වන විටත් ජයන්ත මහතා පාරිතෝෂික දීමනා ලබාගෙන ඇති අතර ඒවා ගණනය කර ඇත්තේ ලැබූ අවසන් වැටුප පදනම් කරගෙනය. ඒ සම්බන්ධයෙන් දැනට කල්පිත තීරණ ගත නොහැක. සේවක අර්ථසාධක අරමුදල් හිමිකමක් වුව ද ගණනය කිරීම අපහසු ය. එවැනි උනන්දුවක් තිබුණේ නම් ඒවා ගණනය කොට ඉල්ලුම් කිරීම පළමුවැනි පාර්ශ්වයේ වගකීම වේ. ඒ නිසා ජයන්ත මහතාට ලබා දිය හැකි සහනය ඉහත සඳහන් හිඟ වැටුප පමණක් වන බවට නිගමනය කරමි.

ප්‍රදානය

1. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන ඩී. එම්. ජයන්ත මහතාට 2002 ජනවාරි සිට 2004 ජුනි දක්වා කාලයට හිඟ වැටුප් ප්‍රතිලාභයක් වශයෙන් රුපියල් අසූ එක් දහස් හය සීයක් (රු. 81,600/-) දෙවන පාර්ශ්වයේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ගෙවිය යුතුය.

2. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන ඩී. එම්. ජයන්ත මහතාට 2004 ජූලි සිට 2006 ජුනි දක්වා කාලයට හිඟ වැටුප් ප්‍රතිලාභයක් වශයෙන් රුපියල් එක් ලක්ෂ විසිපන්දහස් හතලිහක් (රු. 125,040/-) දෙවන පාර්ශ්වයේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ගෙවිය යුතුය.

3. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන ඩී. එම්. ජයන්ත මහතාට 2006 ජූලි සිට විශ්‍රාම දිනය තෙක් පසු කාලයට වෙනත් වැටුප් ප්‍රතිලාභයක් හිමි නොවේ.

4. මෙම ප්‍රදානයෙන් ලබාදෙන සහනය අවසානාත්මක සහ සම්පූර්ණ ගෙවීමක් විය යුතු වේ.

5. මෙම ප්‍රදානයන් *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට මසක් ඇතුළත මෙහි පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන ඩී. එම්. ජයන්ත මහතාට ඉහතින් දක්වූ ගෙවීම්වලට අදාළ මුදල් දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

මෙම ප්‍රදානය සටහන් කිරීම නොවැළැක්විය හැකි හේතු නිසා බෙහෙවින් ප්‍රමාද වීමෙන් පාර්ශ්වකරුවන්ට යම් අපහසුතාවක් සිදු වුනි නම් ඒ පිළිබඳ කණගාටුව පළ කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු,

2019 ජුනි මස 20 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

08 - 657

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.